(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 1(11).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 ඔක්තෝබර් 15 බ්‍රහස්පතින්දා**

---

**2020 නොවැම්බර් 03 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2020

ගරු හේෂා විතානගේ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් —

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන් —

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදු කරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

100/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජනතාවගේ නීති ගැටලු කඩිනමින් විසඳීමටත්, නීති උපදෙස් ලබා ගැනීමටත්, එක් මහේස්ත්‍රාත් අධිකරණ බලප්‍රදේශයක් සඳහා අවම වශයෙන් එක් නීතිඥ වෘත්තිකයෙකු, පොලිස් නඩු මෙහෙයවීමේ නිලධාරි (prosecutor) ලෙස අදාළ බලප්‍රදේශය වෙනුවෙන් පත් කිරීම තුළින් ශ්‍රී ලංකා පොලීසියෙන් සේවය ලබා ගන්නා ජනතාවට විශාල සේවයක් සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත නව තනතුර ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, එම අදාළ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

149/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම මිශ්‍ර ජාතික පාසල වන කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය, නාට්‍ය හා රංග කලාව යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 02 බැගින්ද, දෙමළ භාෂාව, චිත්‍ර කලාව, තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාව, ගිණුම්කරණය, සන්නිවේදන හා මාධ්‍ය, බෞද්ධ ශිෂ්ටාචාරය යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 01 බැගින්ද, ශිෂ්‍ය උපදේශනය, ගුරු පුස්තකාල තනතුරුවල පුරප්පාඩු 01 බැගින් ද පවතින බවත්;

(ii) අනධ්‍යයන කාර්ය මණ්ඩලය තුළද සනීපාරක්ෂක කම්කරු, උද්‍යාන කම්කරු සහ සාමාන්‍ය කම්කරු තනතුරුවල පුරප්පාඩු 02 බැගින්ද, විද්‍යාගාර සහායක තනතුරේ පුරප්පාඩු 03 ක් ද, කළමණාකරණ සහකාර තනතුරේ පුරප්පාඩු 01ක් ද පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශයට ඇති සැලසුම් සහ එම පුරප්පාඩු පුරවන ලබන නිශ්චිත දින වකවානු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

190/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන්,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ඇති ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා ක්‍රිකට් සංගම් 25ක් තිබෙන බවත්;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා නොදීමට;

(ii) තම ලියාපදිංචිය ඉල්ලා කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය අවස්ථා ගණනාවකදීම අයදුම් කර ඇතත් මෙතෙක් ලියාපදිංචි නොකිරීමට;

හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයෙන් පසුව කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආධාර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

252/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හන්තාන වතුයාය මහනුවර දිස්ත්‍රික්කයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Division) සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

414/2020

ගරු හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්තමානයේදී, රැඳවුම් නිවාසවල (රිමාන්ඩ් නිවාසවල), සහතික කළ පාසල්වල, භාරගැනීමේ නිවාසවල සහ නිවර්තන නිවාසවල ආයතන ගතකර ඇති ළමයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් ආයතනයට අදාළව —

(i) ළමයෙකු රැඳී සිටින සාමාන්‍ය කාල පරිච්ඡේදය;

(ii) රජය විසින් එක් ළමයෙකු සඳහා වෙන් කරනු ලබන මුදල;

(iii) අනුයුක්ත කර ඇති කාර්යමණ්ඩලවල කාණ්ඩ සහ මූලික සුදුසුකම්;

(iv) කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව සහ ළමයින් සංඛ්‍යාව අතර අනුපාතය;

(v) ළමයින් නැවත ප්‍රජාව තුළ සමාජගත කිරීම සඳහා ගනු ලබන පියවර;

(vi) මෙම ළමයින්ගේ සුභසිද්ධිය තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර;

(vii) මෙකී ආයතන අධීක්ෂණය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටි;

කවරේද යන්න ද එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ —

(i) ඉහත කී එක් එක් ආයතනයට ඇතුළු වූ සහ පිට වී ගිය;

(ii) එකී ආයතනවලින් පිටව ගොස් නිසි වැටුප් සහිත රැකියාවන්හි නිරතව ප්‍රජාව තුළ සුරක්ෂිතව ජීවත්වන ළමයින් සංඛ්‍යාව;

එතුමා වැඩිදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් ලබා දී ඇති පවුල්, අයත්වන වතු සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඩම් නොමැති වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා ඉඩම් ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

420/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට බොහෝ දුරට වැඩ නිමවෙමින් පවතින “විසල් දඹුල්ල” ජල ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතා ලබා දීමට නියමිත ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කවරේද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතාවයන් ලබා දීම සඳහා ආවරණය නොවන ග්‍රාම නිලධාරී වසම් ගණනාවක් ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තිබෙන බව දන්නේද;

(ii) එම ග්‍රාම නිලධාරී වසම්වල නම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ගෘහ ජල සම්බන්ධතා ලබා නොදෙන ගම්මාන සංඛ්‍යාව කවරේද;

(iv) එම ගම්මානවල නම් කවරේද;

(v) එම ගම්මාන සඳහා ද ගෘහ ජල සම්බන්ධතා ලබාදීමට ඉහත ව්‍යාපෘතිය යටතේ පියවර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

428/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දෛනික විදුලි පරිභෝජනය දළ වශයෙන්;

(ii) මේ සඳහා වන විදුලිය අවශ්‍යතාවය උත්පාදනය කරන ප්‍රභවයන්;

(iii) ජාතික විදුලිබල පද්ධතියට ඉහත එක් එක් ප්‍රභවයෙන් උත්පාදිත විදුලිය, ප්‍රතිශතයක් ලෙස;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2021 වර්ෂය වනවිට රජයේ මැදිහත්වීමෙන් උත්පාදනය කරන විදුලිය ප්‍රමාණය, 2025 වර්ෂය වනතෙක් ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

452/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව නගරයේ දීර්ඝ කාලයක් තිස්සේ ව්‍යාපාර කරමින් වාසය කරන ව්‍යාපාරිකයන්ගේ ඉඩම්වලට හා ජනතාවගේ ඉඩම්වලට ඔප්පු නොලැබීම හේතුවෙන් ඔවුන් අසීරුතාවයට පත්වී ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත ඉඩම් සඳහා ඔප්පු ලබාදීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) එම ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය;

(iii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දෙන දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

484/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට ඇති වාරිමාර්ග යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් වාරිමාර්ග යෝජනා ක්‍රමයෙන් දේශීය කෘෂි ආර්ථිකයට ලැබෙන දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වාරිමාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිතව සිය ජීවන වෘත්තිය සලසා ගනු ලබන ජනතාවගේ ගැටලු විසඳීමට හා ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

492/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව, එළුවන්කුලම ප්‍රදේශයේ, වනාන්තරයක් ගිනි තබා එළිපෙහෙළි කර විනාශ කර ඇති බවට මාධ්‍ය මඟින් වාර්තා වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විනාශය සිදු කරන ලද භූමියේ ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අයිතිය රජය සතුව පවතින්නේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම්වල අයිතිය සතු පාර්ශ්වයන් කවරේද;

(iv) ඉහත වනාන්තරය විනාශ කිරීමට කටයුතු කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) එම පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

507/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් දේශපාලන පදනමින් සමෘද්ධි සහනාධාර ලබා දුන් බව පිළිගන්නේද;

(ii) ඒ හේතුවෙන්, සුදුසුකම් ලැබූ විශාල පිරිසකට එම සහනාධාරය නොලැබුණු බව පිළිගන්නේද;

(iii) "සෞභාග්‍යයෙ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සමෘද්ධි සහනාධාර නොලැබුණු අයට ඒවා ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

(v) සමෘද්ධි සහනාධාරවල වටිනාකම වැඩි කිරීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කර වර්ෂ 25කට ආසන්න වුවද, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට කිසිදු උසස්වීමක් ලැබී නොමැති බව පිළිගන්නේද?

(ii) එම උසස්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමාන රජය විසින් සමෘද්ධි ව්‍යාපාරයේ හා සමෘද්ධි නිලධාරින්ගේ ගැටලු විසඳීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කර ඇති බව දන්නේද?

(ii) එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් ඉදිරිපත් කළ ගැටලු;

(iii) මේ වනවිට ඒ පිළිබඳව ගෙන ඇති පියවර;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

524/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල් අතරින් ස්ථිර විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව;

(iii) මේ වනවිට වැඩබලන විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ පාසල් සඳහා ස්ථිර විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 නොවැම්බර් 04 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

105/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2017.01.01 සිට 2019.01.01 දක්වා ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන එක් එක් ආයතන විසින් —

(i) සිදු කරන ලද කෘත්‍රිම රා වැටලීම් සංඛ්‍යාව;

(ii) අත්අඩංගුවට ගත් කෘත්‍රිම රා ලීටර් ප්‍රමාණය;

(iii) සිදු කරන ලද වැටලීම් මඟින් අයවූ දඩ මුදල්වල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇතැම් රා නිෂ්පාදකයන්ට අනුමත ප්‍රමාණයට වඩා ගබඩා පහසුකම් පවතින බවත්;

(ii) ඔවුන් කෘත්‍රිම රා නිෂ්පාදනය කර ගබඩා කරන බවත්;

(iii) පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් කෘත්‍රිම රා අත්අඩංගුවට ගත්තද, ඇතැම් සුරාබදු නිලධාරින් විසින් ඒවා අධිකරණයට ඉදිරිපත් නොකර, තාක්ෂණික දෝෂ ලෙස පෙන්වා සමථ ගාස්තුවකට යටත්ව වැරදිකරුවන් නිදහස් කරන බවත්;

(iv) කෘත්‍රිම රා නිෂ්පාදනය, තාක්ෂණික දෝෂයක් නොව, ඇතැම් සුරාබදු නිලධාරින් විසින් චේතනාන්විතව එම නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමක් බවත්;

(v) මෙමඟින් රජයට විශාල බදු මුදලක් අහිමි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) කෘත්‍රිම රා නිෂ්පාදනය නැවැත්වීමට අදාළ නීති, සංශෝධනයට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

160/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ල කසළ කන්ද පිහිටි භූමිය නාගරික උද්‍යානයක් බවට පත් කිරීමේ කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය;

(ii) එම ප්‍රතිපාදන යොදවා මේ වනවිට වැඩ අවසන් කර ඇති ප්‍රමාණය;

(iii) තවදුරටත් වැඩ නිම කිරීමට ඇති ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි නගර මධ්‍යයේ පිහිටා ඇති පොදු ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීමට 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මේ වනවිට දස වසරක් ගත වී තිබුණ ද, එම ක්‍රීඩාංගණය දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ප්‍රයෝජනය සඳහා මේ දක්වා භාර දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) මෙම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත මුදලින් පසුගිය වර්ෂ 10 තුළදී වැය කර ඇති මුදල කොපමණද;

(iv) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත් අත්සන් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) කොන්ත්‍රාත් කටයුතු සිදු කරන වර්තමාන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රමාදය, දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කටයුතුවලට කෙතරම් දුරට බලපා තිබේද;

(ii) දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

217/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ මුං ඇට ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම මුං ඇට ආනයනය කළ රටවල්;

(iv) එම මුං ඇට ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට මුං ඇට ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

255/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බෝපිටිය වතුයාය, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද?

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) එම වත්තේ සම්පූර්ණයෙන්ම වගා කළ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) 2015 වර්ෂය වනවිට ඉහත වතුයායේ අතහැර දැමූ කොටස් තිබේද;

(v) එසේ නම්, එම කොටස්වල මුළු බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා, කාලයේදී මෙම වතුයායට අයත් ඉඩම් සහ ගොඩනැගිලි බාහිර පර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ ඉඩම් සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය නොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

429/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා පොලීසිය මගින් ඉමහත් සේවාවක් ඉටුවු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කවරේද;

(ii) එම පොලිස් ස්ථාන නවීකරණය කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලව්ව පොලිස් ස්ථානය නවීකරණය කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

485/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩලය ස්ථාපිත කළ දිනය කවරේද;

(ii) එය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් වී අලෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ මිලදී ගත් වී ප්‍රමාණය කොපමණද;

(iv) පෞද්ගලික අංශයේ වෙළඳුන් විසින් ගොවීන්ගෙන් අඩු මිලට වී මිලදී ගැනීම වැළැක්වීම සඳහා වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 නොවැම්බර් 05 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

60/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් විශ්වවිද්‍යාලයක් ඉදිකිරීමට සැලැස්මක් සකස් කර තිබුණේද;

(ii) ඒ සඳහා මහනුවර ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගැනීමට මුදල් වියදම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඉඩම මිලදී ගැනීමේදී විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කර ඇති වාර්තා මගින් පෙන්වා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

106/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ රා කර්මාන්තය ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) එම කර්මාන්තය ජීවනෝපාය කරගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2019/12/31 දිනට ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී රා නිෂ්පාදනය කරන පුද්ගලයන්/ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිෂ්පාදනාගාරයට අදාළ අනුමත ධාරිතාවයන් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ධාරිතාවයන් එක් එක් ආයතනයට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රා කර්මාන්තයේ නියුක්තවන්නන්ගේ සුභසාධනය වෙනුවෙන් රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

166/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

218/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කව්පි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කව්පි ආනයනය කළ රටවල්වල නම් කවරේද;

(iv) එම කව්පි ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කව්පි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

254/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ග්‍රේට් වැලි වතුයාය, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

350/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සහකාර පොලිස් අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පොලිස් කොස්තාපල් තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර දක්වා සහ සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වූ තනතුරුවල පුරප්පාඩු පවතින්නේද;

(iii) එම තනතුරු සඳහා මෑතකදී කාලානුරූපී උසස්වීම් ලබා දීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iv) ඉහත තනතුරු සඳහා උසස්වීම් ලබා දීමේදී එම තනතුරු සඳහා සිටිය යුතු අනුමත නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් සළකා බැලුවේද?

(v) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සහ නියෝජ්‍ය පොලිස්පති තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා මෑතකදී කාලානුරූපී උසස්වීම් ලබාදීමේදී එම තනතුරු සඳහා සිටිය යුතු අනුමත නිලධාරීන් සංඛ්‍යාව නොසළකා එම ප්‍රමාණය ඉක්මවා වර්ෂ දෙක හමාරක සේවා කාලයක් ඇති නිලධාරීන්ට උසස්වීම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

(vi) ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුර දක්වා කාලානුරූපී උසස්වීම් ලබාදීමේදී, ඉහත (v)හි ක්‍රමවේදය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

415/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ළමා හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනතට අදාළව තීන්දු ලබාදීමට නියමිත නඩු සංඛ්‍යාව කොපමණද;

(ආ) (i) බාල අපරාධ සම්බන්ධ වැරදිකරුවන්ට සහ ළමා ආරක්ෂාවට අදාළ නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පැමිණිල්ල සිදුකළ අවස්ථාවේ සිට නඩුව විසඳා අවසන් වීම දක්වා ගතවන සාමාන්‍ය කාල සීමාව කොපමණද;

(iii) ප්‍රමාදයන් සඳහා හේතු, ප්‍රමාදයන් සිදුවන්නේ කුමන අවස්ථාවන්වලදී ද සහ නඩු ඇසීම වේගවත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ළමයි උසාවි වෙත ප්‍රවාහනය කිරීමට සකසා ඇති වැඩපිළිවෙළ කුමක්ද;

(v) උසාවිය තුළදී දරුවන්ගේ ආරක්ෂාව සහ යහපත සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2015 සිට 2020 දක්වා කාලය තුළ බාල අපරාධ සම්බන්ධ වැරදිකරුවන් සම්බන්ධයෙන්;

(i) අවසන් කළ නඩු ප්‍රමාණය කොපමණද;

(ii) පැමිණිල්ල වාර්තා වූ අවස්ථාවේ සිට චෝදනා ගොනුකිරීම සහ චෝදනා ඉදිරිපත් කර නඩුව අවසානය දක්වා ගතවන කාල සීමාව කොපමණද;

(iii) චෝදනාවලට වැරදිකරුවන් වූ නිදොස් කොට නිදහස් කරනු ලැබූ සහ මුදාහරිනු ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා තව දුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

421/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට බොහෝ දුරට වැඩ නිමවෙමින් පවතින "විසල් මාතලේ" ජල ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතා ලබා දීමට නියමිත උකුවෙල, රත්තොට, මාතලේ, යටවත්ත හා පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කවරේද;

(ii) එම ග්‍රාම නිලධාරී වසම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතාවයන් ලබා දීම සඳහා ආවරණය නොවන ග්‍රාම නිලධාරි වසම් ගණනාවක් ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තිබෙන බව දන්නේද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ගෘහ ජල සම්බන්ධතා ලබා නොදෙන ගම්මාන සංඛ්‍යාව කවරේද;

(iv) එම ගම්මානවල නම් කවරේද;

(v) එම ගම්මාන සඳහා ද ගෘහ ජල සැපයුම් සම්බන්ධතාවය ලබාදීමට ඉහත ව්‍යාපෘතිය යටතේ පියවර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

430/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වයඹ පළාත තුළ දැදුරු ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වැය කළ/කරන මුදල කවරේද;

(ii) ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයාගත් ප්‍රභවයන් කවරේද;

(iii) ව්‍යාපෘතිය සඳහා ඉඩම් පරිත්‍යාග කළ පවුල් සංඛ්‍යාව කවරේද;

(iv) එම පවුල් සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළේද;

(v) එම පවුල් සඳහා වන්දි ගෙවීම වෙනුවෙන් වැයකර තිබෙන මුදල කවරේද;

(vi) මේ වනතෙක් වන්දි ගෙවා නොමැති පවුල් සඳහා වන්දි ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

453/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 215 දිවුල්වැව ග්‍රාම නිලධාරි වසමේ, බඹරඇල ග්‍රාමයේ 1973 වර්ෂයේ සිට හේන් ගොවිතැන් කරන ලද ගොවීන්ගේ සින්නක්කර ඔප්පු සහිත ඉඩම්වලට වනජීවී නිලධාරින් පැමිණ රක්ෂිත මායිම් සළකුණු කර මායිම් කණු දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

517/2020

ගරු සාණක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර කර්මාන්තයේදී හැඹිලි දැල් භාවිතා කිරීම සඳහා යම් සීමාවකට යටත්ව අවසර දී ඇතත් ධීවරයින් එය නිසි අයුරින් භාවිතා නොකිරීම හේතුවෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙරළ ආසන්නයේ ධීවර කර්මාන්තයේ යෙදෙන දේශීය ධීවරයින්ගේ ජීවනෝපායට දැඩි බලපෑම් එල්ල වී ඇති බවත්;

(ii) මෙය පාලනය කිරීම අසීරු කාර්යයක් වී ඇති හෙයින් නව තාක්ෂණය භාවිතා කරමින් විසඳුම් ක්‍රියාත්මක කිරීම අනිවාර්යය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

525/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මේ වනවිට එම පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ක්‍රීඩා පාසල් තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

559/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ආරම්භ කරන ලද "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද පාසල් ගොඩනැගිලි සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති එක් එක් පාසල සඳහා ලබා දී ඇති ගොඩනැගිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතරින් වැඩ අවසන් කර තිබෙන ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩ අවසන් නොකරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සඳහා වියදම් වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ව්‍යාපෘතිය නතර කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

607/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ලබා දෙනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් කර දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ "සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව රු.2000.00 සිට රු. 2500.00 දක්වා වැඩි කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම වැඩි කරනු ලබන දීමනාව ලබා දෙන දිනය කවරේද;

(v) විදේශ වන්දනා ගමන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අඩු පොලියට ණය ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේනම්, එය සම්බන්ධීකරණය කරනු ලබන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 06 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

61/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තනතුරු දරන ලද/දරන පුද්ගලයන්ගේ නම් හා ඔවුන්ගේ තනතුරු කවරේද;

(ii) එම කාලසීමාව තුළ එක් එක් පුද්ගලයා නිරත වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් නිලධාරියාගේ නිල විදේශ සංචාර සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නිල විදේශ සංචාර තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ ප්‍රතිලාභ කවරේද;

(v) යම් ප්‍රතිලාභයක් ලබා තිබේ නම්, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

108/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා ලබා දෙන ත්‍රිපෝෂ පෝෂණ අතිරේකය ප්‍රමාණවත් හා විධිමත් පරිදි නොලැබෙන බවත්;

(ii) ළමා මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමක පැවතීමට මෙම තත්වයද එක් හේතුවක් බවත්;

(iii) ඒ හේතුවෙන්, දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ත්‍රිපෝෂ කිලෝග්‍රෑම් ප්‍රමාණය කොපමණද යන්න ගණනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි ත්‍රිපෝෂ නිෂ්පාදනයට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කුමන ආකාරයෙන්ද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

167/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ සිදු කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

422/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ හතරවන අදියරෙහි (කුරුණෑගල - දඹුල්ල) වර්තමාන තත්ත්වය මෙම සභාවට දන්වන්නේද;

(ii) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමි වන්නන් සඳහා ගෙවනු ලබන වන්දි මුදල පිළිබඳව මේ වනවිට නිශ්චය කර තිබේද;

(iii) එසේ නම්, එය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන්, විහාර සන්තක දේපළ භුක්ති විඳින්නන්ගේ අහිමිවන දේපළ සඳහා වන්දි ගෙවනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා වන්දි ගෙවීමේදී—

(i) භූමිය සඳහා ගෙවීම් කරන අනුපාතය;

(ii) සංවර්ධන වටිනාකම සඳහා ගෙවීම් කරන ආකාරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගය මේ වනවිට ඉදිකරමින් පවතින බවත්;

(ii) එම අධිවේගී මාර්ගයේ කොටසක් අලව්ව හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ඉදිකරන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඉහත ප්‍රදේශවල ජීවත්වන පවුල්වලින් අත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම අත්කර ගැනීම් වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කර තිබේද;

(iii) නොඑසේ නම්, සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

489/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජාතික පාසල්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවම ජාතික පාසල් සංඛ්‍යාවක් සහිත දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ජාතික පාසල් සංඛ්‍යාව ඉහළ දැමීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

500/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ගම්මාන අතරින් පානීය ජල දුෂ්කරතා ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

518/2020

ගරු සාණක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1973 දී පමණ ආරම්භ කර දැනට වසර තුනකට අධික කාලයක සිට අක්‍රියව පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයට යාබදව පිහිටා ඇති අයිස් කර්මාන්ත ශාලාව නැවත ප්‍රතිසංස්කරණය කර ක්‍රියාත්මක කළ යුතු බවත්;

(ii) එමගින් ධීවර බෝට්ටු සහ මාළු දැල් උපයෝගී කර ගනිමින් ධීවර කර්මාන්තයේ නිරත වන සහ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ නිරත වන දේශීය ධීවරයන්ට සෙත සැලසෙන අතර ඔවුන්ගේ ජීවනෝපායද ඉහළ නැංවීමට අවස්ථාව උදාවන බවත්;

(iii) එහි පවතින ගබඩා පහසුකම් නිසා ශික්ෂණ රෝහලට සහ වෙනත් විවිධ ආයතනවලට අවශ්‍ය මුහුදු ආහාර ගබඩා කර බෙදාහැරීම සිදු කළ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අයිස් කර්මාන්තශාලාව ප්‍රතිසංස්කරණය කර නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

521/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සහකාර පොලිස් අධිකාරී තනතුරේ පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණය සඳහා නිලධාරින් කැඳවූයේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

(iii) සම්මුඛ පරීක්ෂණය කැඳවා තිබූ කාලය තුළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සංශෝධනය කළේද;

(iv) එසේ ක්‍රමවේදය සංශෝධනය කිරිම යෝග්‍යද;

(v) එම ක්‍රමවේදය සංශෝධනය කිරීම පිළිබඳව අයදුම්කරුවන් දැනුම්වත් කළේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරන අතරතුර අයදුම් කළ නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය පෙරදාතම් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම නිලධාරින්ගේ නම් කවරේද;

(iii) එසේ පෙරදාතම් කිරීමේ පදනම කවරේද;

(iv) අනතුරුව, කිසිදු දැනුම්දීමකින් හා හේතු දැක්වීමකින් තොරව සම්මුඛ පරීක්ෂණය කල් දැමුවේද;

(v) මේ වනවිට සම්මුඛ පරීක්ෂණයේ තත්ත්වය කවරේද;

(vi) සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පවත්වන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) සහකාර පොලිස් අධිකාරි තනතුරේ රාජකාරි ආවරණය කිරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයේ නිලධාරින් යෙදවූයේද;

(ii) එසේ නම්, එම රාජකාරි කවරේද?

යන්නත් වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

526/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පාසලේ මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුරු පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ වැඩිහිටි නිවාස සම්බන්ධයෙන් නියාමනයක් සිදු කරනු ලබන්නේද;

(ii) එම නිවාස සම්බන්ධයෙන් ප්‍රමිතියක් තිබේද;

(iii) එසේ ප්‍රමිතියට අනුකූල නොවන වැඩිහිටි නිවාස නවීකරණය කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන එක් එක් වැඩිහිටි නිවාස අතරින් රජය, පුද්ගලික අංශය සහ රජය හා පුද්ගලික අංශය ඒකාබද්ධව පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2020

ගරු රවුෆ් හකීම් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ ආඥා පනත අනුව යම් භූමියක් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට සම්පූර්ණ විය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(ii) වන සංරක්ෂණ ආඥාපනත යටතේ මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වනාන්තරය, රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කළ දිනය, එයට අයත් වන භූමි ප්‍රමාණය හා අදාළ සිතියම් පිළිබඳ සියලු විස්තර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

716/2020

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු තීන්දු ලබා දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 24 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු තීන්දු සිංහල භාෂාවෙන්ද ලබා දීමට කටයුතු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.19/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයින්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත් වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/2020

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— ශ්‍රී ලංකාව තුළ තැපැල් සේවය ව්‍යාප්ත කොට තිබෙන නමුත්, වර්තමානය වනවිට වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව සඳහා තැපැල් සේවාව විධිමත් කිරීමක් සිදුවී නොමැති හෙයින් ඔවුන් විවිධ අපහසුතාවන්ට ලක් වී සිටින හෙයින් ද, අවුරුදු එකසිය පනහකට ආසන්න කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2020

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශ වල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය පිළිගැනීම,— ශ්‍රී ලංකා ඉතිහාසයේ ආර්ථික වර්ධනය සඳහා අතිවිශාල දායකත්වයක් සපයන කඳුරට වතු කම්කරුවන් තම අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ ලබාගෙන ඇති හෙයින්, එවැනි අරගලයන්හි දී දිවිපිදූ වෘත්තීය සමිති විරුවන් පොදු දිනකදී අනුස්මරණය කළ යුතු යැයි ශ්‍රී ලංකාවේ ජීවත්වන ඉන්දීය සම්භවයෙන් යුත් කඳුරට ජනතාවගේ දීර්ඝ කාලීන ඉල්ලීම සලකා බලා ඒ අනුව වාර්ෂිකව ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය සැමරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2020

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම් වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගොඩගසා ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුලත් ගොවීන්ගේ ගැටලු විසඳීම,— වයඹ පළාතේ සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් බුලත් වගාවේ නිරතව සිටින අතර, වර්තමානය වනවිට එම බුලත් ගොවීන්ට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් එම තත්ත්වය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පුරන් වූ කුඹුරු අස්වැද්දීම,— රටක සංවර්ධනය සඳහා ආහාරවල සුරක්ෂිතභාවය ඉතා වැදගත් වන හෙයින් වයඹ පළාතේ දැනට පුරන් වී ඇති කුඹුරු යළි අස්වැද්දීම සඳහා කඩිනම් යෝග්‍ය වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම විසඳීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක අලි-මිනිස් ගැටුම ඉතා ප්‍රබලව දක්නට තිබෙන හෙයින් ඒ සඳහා තිරසර විසඳුමක් ලෙස සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම,— වයඹ පළාතේ විශාල පිරිසක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන හෙයින් ද, එම ගොවි ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන හෙයින් ද, වයඹ පළාතේ කුඩා වැව් සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම,— කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බොහෝ ප්‍රදේශවල පුරාවිද්‍යා ස්ථාන රාශියක් තිබෙන හෙයින් අනාගත පරපුර වෙනුවෙන් ඒවා ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2020

ගරු එච්. නන්දසේන මහතා,— වන සීමා පුළුල් කිරීම හේතුවෙන් ගොවියන්ට වසර ගණනාවක් වගා කළ ඉඩම් අහිමි වීමෙන් සිදුවන හානිය වළකාලීම,— 2001.08.10 දින වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලැබූ 5/2001 චක්‍රලේඛය පදනම් කර ගනිමින් වන සීමා පුළුල් කිරීමේදී දීර්ඝ කාලයක් පුරාවට වගා කරන ලද ගොවි බිම්, වන සීමාවට ඇතුළත්වීම හේතුවෙන් එම ගොවි ජනතාවට අසාධාරණයක් සිදුවූ හෙයින් ද, අදාළ නිලධාරීන් වගකීමෙන් කටයුතු කර නොමැති හෙයින් ද, මෙම තත්ත්වයට මුහුණ පා සිටින අසරණ ගොවි ජනතාවට සාධාරණය ඉටුකර දීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2020

ගරු එච්. නන්දසේන මහතා,— රජයේ පාසල්වල වසර 15කට අධික කාලයක් ඉගැන්වීම් කටයුතුවල යෙදී සිටි සිවිල් ආරක්ෂක නිලධාරීන් හට ගුරු පුහුණුව ලබා දී ගුරු සේවයට ඇතුළත් කර ගැනීම,— ත්‍රස්ත ප්‍රහාර උත්සන්නව පැවති සමයේ දී තර්ජිත ගම්මානවල පිහිටි පාසල්වල විශාල ගුරු හිඟයක් පැවති හෙයින්, පාසල් දරුවන් සඳහා ඉගැන්වීම් කටයුතු වර්තමානය දක්වාම සිවිල් ආරක්ෂක නිලධාරීන් පිරිසක් විසින් සිදු කරනු ලැබූ හෙයින් ද, උතුරු නැගෙනහිර පළාත්වල එවන් නිලධාරීන් ගුරු සේවයට ඇතුළත් කරගත් හෙයින් ද, උතුරු මැද පළාතේ සිවිල් ආරක්ෂක නිලධාරීන් ද ගුරු සේවයට ඇතුළත් කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් නිසා ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දේශීය කෘෂි නිෂ්පාදනයේ ඉහළ ඵලදායිකත්වය සඳහා වන සතුන්ගෙන් සිදුවන වගා හානි වළක්වාගැනීම හා වගා හානිපූරණය කිරීම,— සුළු පරිමාණ හා ගෙවතු වගා ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව වගා කරන සාදික්කා, කරාබු, ගම්මිරිස්, පොල්, විවිධ පලතුරු ආදී ස්ථිර බෝග මෙන්ම, අල, ලූනු, එළවළු, වී ආදි කන්න බෝග වගාවන්ට රිලව්, වල් ඌරන්, ඉත්තෑවන්, අලි ආදී විවිධ වන සතුන්ගෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා අදාළ සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ජාතික කෘෂි නිෂ්පාදන ආරක්ෂිත ප්‍රතිපත්තියක් ක්‍රියාාත්මක කිරීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීමට ද, වන සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා පූර්ණ වන්දි ලබාදෙන වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද, රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කිරීම,— දහම් පාසල් අධ්‍යාපනය තුළින් ගුණ දහමෙන් ශික්ෂිත සමාජයක් ගොඩ නැංවීමට පදනම සැකසෙන නමුදු, එම පාසල්වල පවතින භෞතික සම්පත් හිඟය මත ඇතිවෙන දුෂ්කරතා නිසා බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවන හෙයින් රටේ බහුතරයක් දහම් පාසල්වලට අත්‍යවශ්‍ය ඉගෙනුම් මේස, බංකු, ගුරු මේස, ගුරු පුටු, කළුලෑලි, සුදු ලෑලි මෙන්ම, එහි කුඩා දහම් පුස්තකාල සඳහා පොත් අල්මාරි සපයා දීමටත්, දහම් පාසල් දරුවන් සඳහා ළමා සාරිය, ජාතික ඇඳුම වැනි ඇඳුමක් වෙනුවෙන් අවශ්‍ය රෙදි ලබාදීමටත්, පුද්ගලික අංශයේ හා දානපතීන්ගේ දායකත්වය ද සහිතව රජය විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවක් හා ආර්ථික නායකත්වයක් ගොඩනැඟීම,— ශ්‍රී ලංකාව තුළ අධික පොළියට ක්‍රියාත්මකවන ක්ෂුද්‍රමූල්‍ය ණය, මූල්‍ය සමාගම් ණය, හා කල්බදු ණය උගුලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගලවා ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නවෝත්පාදන නිෂ්පාදන හා අගය එකතු කරන ව්‍යාපාරවල නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කෘෂි නිෂ්පාදකයන්ට හා සේවා සපයන ව්‍යවසායකයන්ට, ලිහිල් කොන්දේසි හා ලිහිල් පොළියකට දිගුකාලීනව ගෙවිය හැකිවන පරිදි මූල්‍ය ණය ලබාදෙන බැංකුවක් ස්ථාපනය කිරීමටත්, රටේ ආර්ථික වර්ධනයට, රැකීරක්ෂා ජනිත කිරීමට හා රටේ සම්පත්වලින් ඉහලම ඵලදායිකත්වයක් ලබාගැනීමට සහය වන ව්‍යවසායක ආර්ථික නායකත්වයක් ගොඩනැඟීමටත්, දැනට ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය ලබාදෙන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර දේශීය ව්‍යවසායකත්ව සංවර්ධන හා ආර්ථික පුනර්ජීවන කාර්යසාධන බලකායක් ඇති කිරීම උදෙසා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම,— රටක අනාගතයේ සබුද්ධික පුරවැසියකු බිහිවීමට මුල් ළමාවිය සංවර්ධනය පදනම් වන හෙයින් දිවයිනේ පෙර පාසල්, දිවා සුරකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතියකින් පැවැත්විය යුතු බැවින් ද, එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කර, නිසි ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම නියාමනය කිරීමටත්, ඒවා පවත්වාගෙන යන ව්‍යවසායකයන්ට හා කාර්ය මණ්ඩලවලට ජාතික වෘත්තීය නිපුණතා (NVQ) සහතිකපත් තිබීම අනිවාර්ය කිරීමටත්, එවන් මධ්‍යස්ථානවල පැවතිය යුතු ඉඩකඩ හා යටිතල පහසුකම් පිළිබඳ නිර්දේශ නීතිගත කිරීමටත්, එහි සේවය කරන්නන්ට දායකත්ව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එවන් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සහන පොළියට ණය පහසුකම් ලබාදීමටත්, අවශ්‍ය ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට රජය විසින් යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— විසිඑක්වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි සමූපකාර ව්‍යාපාරයක් බිහිකිරීම,— ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින සමූපකාර ක්‍රමය දැනට අඩ සියවසකට පෙර පත්කරන ලද සමූපකාර ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත කරන ලද්දක් වන හෙයින් ද, මෙම ව්‍යාපාරය විසිඑක්වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි එනම්, ආත්මාධාරය, අන්‍යෝන්‍යාධාරය හා සකසුරුවම යන සමූපකාර මූලධර්ම මත පදනම්ව වත්මන් සියවසේ අභියෝග ජය ගැනීමට සමත්, නව තාක්ෂණය භාවිතයෙන් මහා පරිමාණ වෙළෙඳ ජාල සමඟ සාර්ථකව තරඟ කළ හැකි ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයටත්, ප්‍රාග්ධන ගැටලුව සහ වෙළෙඳපොළ ගැටලුවලට සාර්ථක විකල්පයක් ලෙසත්, අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයටත් යොදාගත හැකි සුවිශාල වත්කම් ප්‍රමාණයක් හිමි ක්ෂේත්‍රයක් වන හෙයින් ද, වත්මන් සමූපකාර ක්‍රමය ඉහත කී අභිප්‍රායන් සංවර්ධනය කිරීම සඳහා අදාළ නව ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට, සමූපකාර ව්‍යාපාරයේ සැබෑ හිමිකරුවන් වන සමූපකාර කොටස් හිමිකරුවන්ගේ බලය වැඩිකර සමූපකාර ව්‍යාපාරය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— කාන්තා අයිතීන් සුරැකීම හා කාන්තා අභිවෘද්ධිය සැලසීම,— කාන්තාවන්ගේ කායික, මානසික, සාමාජීය සුරක්ෂිතභාවය හා අභිවෘද්ධිය සැලසීම රටේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයක් වන හෙයින්, කාන්තාවන්ට නිසිලෙස නොසැළකීමට එරෙහිව නඩු විභාගයකින් දඬුවම් පැමිණවීමටත්, කාන්තා හිංසනය, අපයෝජනය, බාලවයස්කාර දැරියන් හෝ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධයෙන් ඇප ලබා නොදෙන නීති පැනවීමටත්, පොලිසියේ කාන්තා හා ළමා අංශයේ බලතල පුළුල් කිරීමටත්, නඩත්තු හා දික්කසාද නඩු අප්‍රමාදව විසඳීමට යෝග්‍ය අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, බස් රථවල කාන්තාවන් සඳහා එක් පසක අසුන් පෙළක් වෙන් කිරීමටත්, ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල සූරාකෑමට හසුවන්නන්ගේ ණය කපා හැරීමට නීති පැනවීමටත්, සෑම නිවසකටම ජලය සහ ඉවුම් පිහුම් සඳහා අඩුවියදම් බලශක්තිය සහතික කිරීමටත්, මුළුතැන්ගෙයි උපකරණ සහන පොළියට ගැනීමට බැංකු පහසුකම් ලබාදීමටත්, වැන්දඹු කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා ලබමින් සිටි වැටුප ගෙවීම නීතිගත කිරීමටත්, විරැකියා වැන්දඹුවන්ට රජයෙන් යැපුම් දීමනාවක් ලබාදීමටත්, සමාන සේවයට සමාන වැටුප් ලබාදීම නීතිගත කිරීමට හා කාන්තා නිෂ්පාදන අලෙවියට සුදුසු අලෙවි ජාලයක් ගොඩනැඟීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති අණපනත් සෑදීම සඳහා රජය විසින් කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මැණික් ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉහළ නැංවීම,— මැණික් ඉඩම් හඳුනාගැනීමේ සිට මැණික් වෙළෙඳපොළ අලෙවිය දක්වා කටයුතුවලට විවිධ පාර්ශ්ව සම්බන්ධවීම හා නොයෙකුත් ව්‍යුහයන් ක්‍රියාත්මකවීම සිදුවුවත්, ඒවා අතර අන්තර් සබඳතාවයක් නොමැතිවීම මැණික් ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගතියට හා සංවර්ධනයට මහත් බාධාවක් වන හෙයින්, මෙම කර්මාන්තයට අදාළ ජාතික ප්‍රමුඛතා ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර, කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ අන්තර් සබඳතාවය ගොඩනැංවීමටත්, අගය එකතුකරන ලද මැණික් හෝ මැණික් යොදාගත් නිෂ්පාදන දිරිගැන්වීමට බදු සහන ඇතුලු සානුබල ලබාදීමටත්, මැණික් කර්මාන්තයේ නියැලෙන පතල්කරුවන්ගේ ජීවිත අවදානමට මෙන්ම, පතල් මඟින් පරිසරයට සිදුවන හානි පූර්ණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ඇතිකිරීමටත්, කැණීම් බලපත්‍රයක් ලබාගැනීම පූර්ණ කොන්දේසියක් ලෙස නීතිගත කිරීමටත්, මැණික් ලාභීන්ට ලැබෙන මුදල් ප්‍රති ආයෝජනය කිරීමට අවස්ථා පුළුල් කිරීමටත්, මැණික් මිලදීගැනීමට පැමිණෙන විදේශිකයන්ට පණවන සීමා ඉවත් කිරීමටත්, මැණික් භාවිතකර අත්කම් නිෂ්පාදන ඇතුළු ගෘහ කර්මාන්තය දක්වා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමටත්, අලෙවිකරණය දක්වා සියලු ක්ෂේත්‍රවලදී නව තාක්ෂණය යොදාගැනීමටත් යෝග්‍ය ප්‍රතිපත්ති සහ අණපනත් සැදීමට රජය විසින් පියවර ගනුලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු අපනයන බෝග ආර්ථික මධ්‍යස්ථානයක් ඇතුළත් අපනයන කෘෂි බෝග ආශ්‍රිත නවෝත්පාදන කර්මාන්ත කලාපයක් බිහිකිරීම,— අතීතයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සුළු අපනයන බෝගවලට උරුමව පැවති "සිලෝන් ස්පයිස්" යන කීර්ති නාමය යළි ගොඩනඟා ගනිමින් ගෝලීය වෙළෙඳපොළ ජය ගැනීමට සුළු අපනයන බෝග බහුලව නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක පදනම් කරගත් ආර්ථික මධ්‍යස්ථාන ඇතුළත් එම බෝග ආශ්‍රිත අගය එකතු කරන ලද නවෝත්පාදන කර්මාන්ත කලාප බිහි කරන ලෙසත්, මෙම අපනයන නිෂ්පාදන සඳහා දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කර අපනයන කෘෂි බෝග කර්මාන්තයේ ප්‍රගමනයට අදාළ බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්, සුළු අපනයන බෝග වගාකරුවන් දිරිගැන්වීමට සහනයක් ලෙස අස්වනු අලෙවියෙන් පසු ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම් ලබාදීම සහ ඒ සමඟම වගා රක්ෂණයක් ගොවිමහතුන්ට ලබාදීමේ ක්‍රමෝපායක් ඇතිකිරීමටත් රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— උඩරට නැටුම්, සම්ප්‍රදායික කලා ශිල්ප, ලී කැටයම්, මූර්ති හා ගෘහ නිර්මාණ ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම,— ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය සහ අනන්‍යතාවය විදහාපාන සාම්ප්‍රදායික උඩරට නැටුම් හා කලා ශිල්ප, චිත්‍ර, ලී කැටයම්, මූර්ති සහ ගෘහ නිර්මාණ ශිල්පය අප රටට පමණක් උරුම ඒක දේශීය විරල සංස්කෘතික හා කලා ශිල්ප වන හෙයින්, ඒවා ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, එකී උරුමයන් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමටත්, එම කලා ශිල්ප ආරක්ෂා කරමින් පවත්වාගෙන යන ශිල්පීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, උඩරට උරුමයන් ආරක්ෂා කොට, ප්‍රවර්ධනය කර, විධිමත් ලෙස පාලනය කිරීමට ව්‍යවස්ථාපිත පදනමක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ශ්‍රී ලංකාවේ විදේශ සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමෙන් 8%ක් පමණ දායකත්වයක් විදේශගත ශ්‍රම බලකායෙන් ලැබෙන හෙයින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විදේශීය ශ්‍රම ඉල්ලුමට සමගාමීව ශ්‍රමිකයන් පුහුණු කරන ආයතනයක් ස්ථාපිත කිරීමටත්, විදේශගත පුරවැසියන්ට ඡන්ද බලය භාවිත කිරීමට අවස්ථාව සලසාදීමටත්, ඔවුන්ට දායක විශ්‍රාම වැටුපක් වැනි සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත්, විදේශ සේවය හේතු කොට ගෙන ඇතිවන නොවැළැක්විය හැකි දුර්භාග්‍ය අවස්ථාවල දී මෙන්ම අනතුරු විපත්වල දී වන්දි ලබාදෙන රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ඔවුන්ගේ ඉතුරුම්වලට වැඩි පොලියක් බැංකු මගින් ලබාදීමටත්, නිවාස ඉදිකර ගැනීමට සහන පොලී සහ ණය ලබාදීමටත්, රජයේ රැකියා ලබාදීමේ දී විදේශගත දෙමාපියන්ගේ දරුවන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් සහ මෙරට හා විදේශීය රැකියා ඒජන්සිවලින් සිදුවන අකටයුතුකම් කඩිනමින් විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ශ්‍රමිකයන් ලියාපදිංචියේ දී අයකරන ගාස්තු වලින් හා ගෘහ සේවයට පිටත්වීමේ දී ඒජන්සි ලබාදෙන මුදලින් කොටසක් ලබාගෙන පෙර විගමනික හා පසු විගමනික භාරයක් ඇති කිරීම සඳහාත් රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.